# සමාජීය විද්‍යා සහ මානව ශාස්ත්‍ර ලිපි


මහාචාර්ය චන්ද්‍රා වික්‍රමගමගේ

උපහාර ග්‍රන්ථය

# Essays in Social Sciences and Humanities

In Honour of Professor

Chandra Wikramagamage




Editors

A.A.D. Amarasekara

Uda Hettige

Ratnasiri Arangala

# සමාජීය විද්‍යා සහ මානව ශාස්ත්‍ර ලිපි

## මහාචාර්ය චන්ද්‍රා වික්‍රමගමගේ
## උපහාර ග්‍රන්ථය

# Essays in Social Sciences and Humanities

## In Honour of
## Professor Chandra Wikramagamage

උපදේශක මණ්ඩලය

මහාචාර්ය ලීලානන්ද ප්‍රේමතිලක
මහාචාර්ය සේනක බණ්ඩාරනායක
මහාචාර්ය සරත් අමුණුගම
මහාචාර්ය සුනන්ද මද්දුමබණ්ඩාර

සංස්කරණය

ඒ.ඒ.ඩී. අමරසේකර
උදා හෙට්ටිගේ
රත්නසිරි අරංගල

සහාය සංස්කරණය

නදීෂා ප්‍රනාන්දුපුල්ලේ

ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ
රාජ්‍ය සම්මාන ලත් පොත් ප්‍රකාශකයෝ
675, පී. ද ඇස්. කුලරත්න මාවත,
කොළඹ 10.

මෙහි සංග්‍රහ කෙරෙන ලිපිවල අන්තර්ගතය සම්බන්ධ
සියලු වගකීම් අදාල ලේඛකයන් සතු ය.

ප්‍රථම මුද්‍රණය: 2012

සමාජීය විද්‍යා සහ මානව ශාස්ත්‍ර ලිපි
මහාචාර්ය චන්ද්‍රා වික්‍රමගමගේ උපහාර ග්‍රන්ථය

© ඒ.ඒ.ඩී. අමරසේකර
උදා හෙට්ටිගේ
රත්නසිරි අරංගල

ISBN 978-955-30-3412-0

අක්ෂර සංයෝජනය:
නදීෂා ප්‍රනාන්දුපුල්ලේ

පිටකවර නිර්මාණය:
ගොඩගේ පොත් මැඳුර

ප්‍රකාශනය:
**ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ**
675, පී. ද ඇස්. කුලරත්න මාවත, කොළඹ 10.

මුද්‍රණය:
**චතුර මුද්‍රණාලය,**
69, කුමාරදාස පෙදෙස, වැල්ලම්පිටිය.

14447/1784/250

# පටුන


- ලිපි සම්පාදනය
- සංස්කාරක සටහන
- මහාචාර්ය චන්ද්‍රා වික්‍රමගමගේ විද්වතාණෝ 17
  ඒ.ඒ.ඩී. අමරසේකර
- **Traditional Rural Organizational Patterns with Special References to the North Central Province** 29
  H.A.P. Abeywardena
- සීගිරි සිතුවම් පිළිබඳ විමර්ශනයක් 39
  මාලිංග අමරසිංහ
- ලක්දිව සෙල් ලිපි ගවේෂණ ආරම්භය හා ඩී. එම්. ද ඉසෙඩ්. වික්‍රමසිංහගේ කාර්යසාධනය 51
  රත්නසිරි අරංගල
- ප්‍රඥා පාරමිතා සූත්‍ර වන්දනාව සහ ප්‍රතිමා නිර්මාණය 90
  බෙල්ලන්විල විමලරතන හිමි
- ධර්මසේන පතිරාජගේ වෘත්තාන්ත සිනමාව (1969-1981) (විචාරක මත ද ආශ්‍රිත විමර්ශනයකි) 102
  ජිනදාස දනන්සූරිය

- ධර්මය, විනය හා ආදි බුදුසමය — 131
  දේවාලේගම මේධානන්ද හිමි

- **Humanistic Teaching In Indian Thoughts** — 146
  Daya Edirisinghe

- **Maintenance, Finance and the Distribution of Wealth in the Buddhist Monasteries: A Historical Perspective** — 161
  Prishanta Gunawardhana

- ප්‍රාග් ඓතිහාසික මානවයාගේ විඥානයේ ස්වභාවය: එය අධ්‍යයනය කිරීමේ ප්‍රවේශ පිළිබඳ අධ්‍යයනයක් — 172
  ගාමිණී හපුආරච්චි

- ශ්‍රී ලාංකික චිත්‍ර කලාවේ බෞද්ධ අනන්‍යතාවය — 193
  උදා හෙට්ටිගේ

- **The Evolution of the Bodhisattva Concept** — 225
  Rev. Iththademaliye Indasara

- සම්භාව්‍ය සිංහල පද්‍ය සාහිත්‍යය: භාෂා ප්‍රභූත්වය හා සංස්කෘතික විඥානය — 236
  ආනන්ද තිස්ස කුමාර

- ප්‍රේතවස්තු වර්ණනයෙන් ආභාසය ලද නූතන සිංහල කෙටිකතා — 249
  සුසන්ත මහඋල්පත

- සංස්කෘත වාක්කෝෂය පෝෂණයෙහිලා
  ලාංකේය ශිල්පග්‍රන්ථවල දායකත්වය 264
  වෝල්ටර් මාරසිංහ

- කායික වේදනා සහනය 294
  නාබිරිත්තන්කඩවර ඤාණරතන හිමි

- සිංහලයේ අත්තනෝ පද ක්‍රියා ව්‍යවහාරය 304
  ඔක්කම්පිටියේ පඤ්ඤාසාර හිමි

- **Colour Classification of Sinhalese Ritual** 319
  Chandrasiri Palliyaguru

- පුනරුත්ථාපනය - මනෝ ප්‍රතීකාරය හා
  මනෝ - සමාජ සංවර්ධනය 329
  ඥානදාස පෙරේරා

- ශ්‍රී ලංකාවේ නවීකරණය: යටත් විජිත
  යුගයේ සිට පශ්චාත් යටත් විජිත යුගය
  දක්වා 346
  බී.ඒ.ටෙනිසන් පෙරේරා

- **The Buddha Image of Sri Lanka** 358
  Leelananda Prematilleke

- 'තුළ' භාවිතය පිළිබඳ වාග්විද්‍යාත්මක
  විග්‍රහයක් 370
  ආර්.එම්.ඩබ්ලිව්. රාජපක්ෂ

- ලෝක පුවත්පත් ඉතිහාසය 376
  මාපා තිලකරත්න

- ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යා අර්ථකථන ගැන විමසීමක් 385

  චන්ද්‍රා වික්‍රමගමගේ

- සම්මානිත මහාචාර්ය චන්ද්‍රා වික්‍රමගමගේ ග්‍රන්ථාවලිය 403

- Review Articles

A fine presentation on Buddhist iconometry 407

Nemsiri Mutukumarana

Sri Lankan Buddhism through Buddhist Iconography 410

Asanga Tilakaratne

Anuradhapura in all its glory 416

Vini Vitharana

Provocative book on the Stupa 422

Chandima Wijebandara

# සංස්කාරක සටහන

විසි වන සියවසේ තෘතීය දශකයෙහි ජන්ම ලාභය කොට, නූතන ශ්‍රී ලාංකේය විද්වජ්ජන සංසදයෙහි තෘතීය පරම්පරාව නියෝජනය කරමින් අර්ධ ශතවර්ෂාධික කාලයක් ලේඛකයකු, විශ්වවිද්‍යාලයීය ආචාර්යවරයකු, පර්යේෂකයකු හා භාෂාශාස්ත්‍ර, ධර්මසමය, ආදි ප්‍රාචීන අධ්‍යයන ක්ෂේත්‍රයන්හි මෙන් ම පුරාවිද්‍යා පර්යේෂණ හා කළමනාකරණ ක්ෂේත්‍රයෙහි ද අභිවර්ධනයට ස්වකීය ඥාන ශක්තීන් හා ජීවිත පරිඥානය නිශ්හරණාධ්‍යාශයෙන් යුක්ත ව කැප කළ චන්ද්‍රා වික්‍රමගමගේ විද්වතාණන්ගේ පන්සැත්තෑ වන ජන්ම සංවත්සරය නිමිත්තෙන් අභිස්තව සංග්‍රහයකින් එතුමන්හට විද්වජ්ජන ප්‍රසාදන පිරිනැමීම මේ ශාස්ත්‍රීය ලේඛන සංග්‍රහයෙහි අරමුණ වේ.

වර්ෂ 1935 දී රෝහණ දේශයේ ලබුහේන්ගොඩ ග්‍රාමයෙහි ජන්ම ලාභය කළ චන්ද්‍රා වික්‍රමගමගේ ළදරුවා ගමේ පාසලෙන් මූලික අධ්‍යාපනයට පිවිස ද්විතීය අධ්‍යාපනය සඳහා මාතර තිහගොඩ ශ්‍රී රතනජෝති පරිවේණස්ථ විද්‍යාස්ථානයට ඇතුළු වූයේ ය. තදනන්තර ව ගාල්ලේ ශ්‍රී විද්‍යාලෝක පරිවේණස්ථානයෙහි ශාස්ත්‍රෝද්ග්‍රහණයෙහි යෙදුණු චන්ද්‍රා වික්‍රමගමගේ විද්‍යාර්ථියා ප්‍රාචීන මධ්‍ය පරීක්ෂණයෙන් උත්තීරණය ලැබීමෙන් අනතුරු ව නූතන විෂයවිෂයාන්තර ශික්ෂාග්‍රහණය පිණිස විද්‍යාලංකාර විශ්වවිද්‍යාලයට (වර්තමාන කැලණිය විශ්වවිද්‍යාලය) ඇතුළත් වූයේ ය. එහි දී පාලි භාෂා සාහිත්‍යය ස්වකීය මුඛ්‍ය විෂයය වසයෙන් ද සිංහලය අනුවිෂයය වසයෙන් ද තෝරා ගනිමින් ගෞරව ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලාව හැදෑරූ මේ තරුණ ශාස්ත්‍රවන්තයා ස්වකීය ශිෂ්‍ය අවධියෙහි ම ශාස්ත්‍රීය ලේඛන සංග්‍රහ සංස්කරණයෙන් විද්වත් කතිකාවන් කරා යොමු වූයේ ය.

සමකාලීන ගෘහස්ථ හා ප්‍රව්‍රජිත ප්‍රමුඛ විද්වතුන් ඇසුරෙන් ස්වකීය ශාස්ත්‍ර ප්‍රභාව හා නිර්මාණාවේශය මෙන් ම සමාජ කැපවීම හා බුද්ධි ගවේෂණයෙහි වන ජිඥාසාව ද දල්වා ගත් මේ තරුණයා විශ්වවිද්‍යාලයෙහි ප්‍රථමෝපාධි පරීක්ෂණයෙන් උත්තීරණ වීමෙන් අනතුරු ව කෙටි කලක් සාම්ප්‍රදායික පරිවේණාධ්‍යාපන ක්ෂේත්‍රයෙහි ගුරු භූමිකාවෙහි නිමග්න වෙමින් යුව ජනයාට ශාස්ත්‍ර ඥාන

විතරණයෙහි නිරත ව සිටියේ ය. සමකාලීන විද්වතුන් අතරෙහි හිමි වූ පිළිගැනීම හා ගෞරවය හේතුවෙන් නො බෝ කලකින් ම ජාතික විශ්වවිද්‍යාලය පද්ධතියෙහි ආචාර්ය මණ්ඩලයෙහි ද්වාරය මෙතුමන්ට විවර විය. ඒ අනුව චන්ද්‍රා වික්‍රමගමගේ තරුණ විද්වතාණෝ වර්ෂ 1969 දී විද්‍යෝදය (වර්තමාන ශ්‍රී ජයවර්ධනපුර) විශ්වවිද්‍යාලයයේ සහාය කථිකාචාර්ය ධුරයකට පත් කර ගනු ලැබූහ. වසර කිහිපයක් සහාය කථිකාචාර්යවරයකු වසයෙන් ගත කිරීමෙන් අනතුරු ව ශාස්ත්‍රපති පරීක්ෂණයෙන් උත්තීරණය වූ මේ විද්වතාණන්ට ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ධුරයට උසස් වීමක් හිමි වූ අතර සමගාමී ව විශ්වවිශ්‍රැත ශාස්ත්‍රායතනකයකට අනුබද්ධ ව ආචාර්යෝපාධිය හැදෑරීමට මං පෙත් විවර වීමත් සමඟ මේ තරුණ විද්වතාණන්ගේ ශාස්ත්‍රීය ජීවන මාර්ගයෙහි නව ද්වාරයක් විවර වූයේ ය.

සමසතළිස් වියේ දී ආචාර්යෝපාධිධරයකු ලෙසින් පෙරළා දිවයිනට සැපත් වීමෙන් අනතුරු ව චන්ද්‍රා වික්‍රමගමගේ විද්වතාණෝ පස්විසි වසකට අධික කාලයක් විද්‍යෝදය (පසු ව ශ්‍රී ජයවර්ධනපුර) විශ්වවිද්‍යාලයයෙහි ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ධුරය තෙක් කුසලතා පදනමින් උසස් වීම් ලබමින් ශිෂ්‍යප්‍රිය ආචාර්යවරයකු ලෙසින් මෙන් ම ආයතනයේ චිරජීවනයට කැප වූ පරිපාලකයකු ද සහෝදර ආචාර්ය මණ්ඩලයේ උන්නතිය වෙනුවෙන් ක්‍රියාශීලී වූ සන්මිත්‍රයකු ද ලෙසින් බහුවිධ භූමිකාවන්හි නිරත වෙමින් ශාස්ත්‍රෝද්දීප්තිය ද ආයතනයේ හා ශිෂ්‍ය ආචාර්ය උභය පාර්ශ්වයන්හි ද චිර ජීවනය වෙනුවෙන් කාර්යසාධනයෙහි නිරත වූහ. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සේවාවට අමතර ව දිවයිනේ සෙසු විශ්වවිද්‍යාලයයන්හි ද පාලි, බෞද්ධ දර්ශනය, ඉතිහාසය හා පුරාවිද්‍යාව ආදි විෂය රාශියක් සම්බන්ධයෙන් ආරාධිත ආචාර්යවරයකු වසයෙන් සේවය කළ මෙතුමන් යටතේ තද් විෂයාශ්‍රිත ව පශ්චාද්උපාධි පර්යේෂණයන්හි නිරත ව ශාස්ත්‍රපති, දර්ශනපති හා දර්ශනසූරී උපාධි ලැබූ පිරිස් මේ වන විට දිවයිනේ මෙන් ම දේශාන්තරයන්හි විශ්වවිද්‍යාලයයන්හි මෙන් ම රාජ්‍ය අංශයේ මෙන් ම පෞද්ගලික අංශයේ ද තනතුරු හොබවති. විශ්වවිද්‍යාලය පද්ධතියට අමතර ව සංස්කෘතික අමාත්‍යාංශය හා සංස්කෘතික කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව, අධ්‍යාපන

අමාත්‍යාංශය, විභාග දෙපාර්තමේන්තුව, ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව ආදි සංස්කෘතික හා අධ්‍යාපන ක්ෂේත්‍රානුබද්ධ රාජ්‍ය ආයතනයන්හි ද උපදේශකත්වයෙන් එතුමාණෝ මහා ජාතික සේවාවක නිරත වූහ.

මෙසේ නන් විධ ක්ෂේත්‍රයන්හි අධ්‍යාපන, පර්යේෂණ, පරිපාලන කර්තව්‍යයන්හි නිරත වීමෙන් දේශයේ සංජස්කෘතික පුනර්ජීවනය උදෙසා ඉටු කළ මහාර්ඝ කාර්යසාධනය අගයනු වස් එතුමන්ගේ වයස්‍යයන්ගේ හා ශිෂ්‍යගණයාගේ මූලිකත්වයෙන් මේ අභිස්තව සංග්‍රහය සම්පාදනය කෙරේ. එය ශ්‍රී ලාංකේය සංස්කෘතික ක්ෂේත්‍රයෙහි මං සලකුණක් වනු නිරනුමානය.

තමන් නමින් මෙවැනි සංග්‍රහයක් සම්පාදනය කෙරෙන වග අප විසින් දන්වනු ලැබූ කල්හි චන්ද්‍රා වික්‍රමගමගේ විද්වතාණෝ නිහතමාන ගුණෝපේත ව ඊට අනුකූලතාව පළ කළහ. ඒ සම්බන්ධයෙන් අපි එතුමන්ට අපේ කෘතඥතාව පුද කරමු.

අපේ ආරාධනයෙන්, චන්ද්‍රා වික්‍රමගමගේ විද්වතාණන්ට ස්වකීය කෘතවේදිත්වය හා උපහාරය පිරිනමනු වස් ශාස්ත්‍රීය ලේඛන සම්පාදනයෙන් දායක වූ විද්වතුන් සියලු දෙනාහට මෙහි ලා සංස්කාරකවරුන්ගේ ස්තුතිය පිරිනැමේ. හුදු ශාස්ත්‍රෝන්නතිය ම සලකමින් මෙහි ප්‍රකාශන භාරය ඉසිලීමේ සත්කාර්යයට ඉදිරිපත් වූ සම්මානිත ග්‍රන්ථ ප්‍රකාශක දේශබන්ධු සිරිසුමන ගොඩගේ සිරිමතුන්ටත් මෙහි සංස්කරණ, මුද්‍රණ හා ප්‍රකාශන කාර්යාවලියෙහි ලා ශ්‍රම දායකත්වය සැපයූ සජ්ජනයන්ටත් අපේ කෘතවේදිත්වය පිරිනමමු.

සංස්කාරකවරු<br>2012-01-30

# ශ්‍රී ලාංකීය චිත්‍ර කලාවේ බෞද්ධ අනන්‍යතාවය

උදා හෙට්ටිගේ

## හැඳින්වීම

පෙරදිග හා අපරදිග ලෝකයේ බොහෝ රටවල දක්නට ලැබෙන පුරාණ චිත්‍ර සාධක අපට හමුවන්නේ ප්‍රාග් ඓතිහාසික යුගවල පටන්මය. ඒ අතරින් අපරදිග කලාපීය රටවල චිත්‍ර පෙරදිග රටවලට වඩා දියුණු ලක්ෂණ පෙන්නුම් කරයි. ඇල්ටමීරා හා ලැස්කෝ චිත්‍ර සටහන් ඊට නිදසුන් සපයයි. ඉන්දියානු ගුහා සිතුවම් තුළින් ආසියානු කලාපීය රටවල මුල් කාලීන කලාව කෙරෙහි නිදසුන් සපයා ගැනීම දුෂ්කර නොවේ. මධ්‍ය ඉන්දියාව පෙරටු කොටගෙන උතුරු හා නැගෙනහිර කලාප මෙන්ම සෙසු කලාපීය රටවල ද මෙවැනි චිත්‍ර දක්නට ලැබීම අපට වැදගත් වේ. ශ්‍රී ලාංකීය ප්‍රාථමික ගුහා සිතුවම් පිළිබඳව අවධානය යොමු කිරීමේදී දැනට අනාවරණය වී ඇති ස්ථාන සමූහය තුළ ඒකාග්‍රතාවයක් දක්නට ලැබේ. අන්තර්ගතය, ශෛලිය, වර්ණ, ශිල්ප ක්‍රමය, නිර්මාණශීලීත්වය ආදී සියලු අංගවල මෙකී ලක්ෂණ හඳුනා ගත හැකිය. සත්ත්ව ආකෘති පෙරටු කරගත් මානව රූප, ඇඳිහිලි ආකෘති සහ වෙනත් සංකේත ආශ්‍රයෙහි නිර්මිත ශ්‍රී ලාංකීය ගුහා චිත්‍රවල අන්තර්ගතය බොහෝ විට කේවල හා යුගල රූප වලට පමණක් සීමා වීම විශේෂය.

සාමූහික සංසිද්ධි මේ තුළ චිත්‍රණය නොවීමේ ලක්ෂණ විශේෂ වේ. මෙම චිත්‍ර බොහෝ විට ස්වාභාවික ලෙන් පදනම් කොටගෙන දක්නට ලබේ. ප්‍රාග් ඓතිහාසික ජන කණ්ඩායම් ආශ්‍රයේ වූ ජනාවාස භූමි පෙරටු කොටගෙන මෙම චිත්‍ර හමුවේ.

අනුරාධපුර යුගයේ මුල් භාගයේ හමුවන සීගිරි බටහිර ලෙන් චිත්‍ර කාන්තා රූප වලට පමණක් සීමා වූ සුවිශේෂී චිත්‍ර නිදර්ශනයන්ය.

ලාංකීය චිත්‍රකරණයේ සංසිද්ධීන් අතර ප්‍රධානතම ස්ථානයක් වන සීගිරි චිත්‍රවල ලෞකිකත්වය පෙරදැරි කොට ඇති ලක්ෂණය මත අන්තර්ගතය හා නිර්මාණ ස්ථානයෙහි බෞද්ධාගමික පසුබිමක් දක්නට නොලැබේ.

ඉන්පසු ලාංකීය චිත්‍ර ඉතිහාසයේ හමුවන බොහෝ නිදර්ශන ස්ථානීය සුවිශේෂත්වය හා අන්තර්ගතය අනුව බෞද්ධාගමික පසුබිමක් මත නිර්මාණය වූ ඒවා බව පෙනේ. වාහල්කඩ, ධාතුගර්භ, ලෙන්, ගිරි විහාර, ලෙන් විහාර ආදී වශයෙන් ස්ථාන ගණනාවක් හඳුනා ගැනීමට හැකිවේ. ශ්‍රී ලංකාවේ හමුවන සිතුවම් නිදර්ශන අතර කතෝලික චිත්‍ර හා මුස්ලිම් පල්ලි ආශ්‍රිත චිත්‍ර හැර බෞද්ධ චිත්‍ර ස්ථාන ගණනාවක් හඳුනා ගැනීමට හැකියාව ලැබේ.

බුදුසමය ව්‍යාප්ත වීමේ ප්‍රතිඵලයක් ලෙස ගොඩනැගුණු බෞද්ධ සංස්කෘතියෙහි දායාදයන් වශයෙන් චිත්‍ර කලාව ද ලොව බොහෝ රටවලට ව්‍යාප්ත වූ බව දක්නට හැකිය. ඉන්දියාව කේන්ද්‍ර කරගනිමින් පෝෂණය වූ බෞද්ධ සමාජයන් ඈත පෙරදිග රටවලට ද ව්‍යාප්ත වූ බවක් දක්නට ලැබේ. බුදුසමය ඇරඹූ ධර්ම ප්‍රචාරක කටයුතු විශේෂයෙන්ම මෙයට හේතු වූ බව පෙනේ. ථෙරවාදී හා මහායාන බුදුසමය පෙරදිග රටවල් කරා ව්‍යාප්ත වනවාත් සමඟම බෞද්ධ සංස්කෘතික සාහිත්‍යය ද පෝෂණය විය. මේ සමඟම බොද්ධ ගෘහ නිර්මාණ ශිල්පීය අංග හා බෞද්ධ කලා කෘති නිර්මාණය වීමේ ක්‍රියාදාමය ඇරඹි බවක් දක්නට ලැබේ. මුල් බුදු සමයෙන් පෝෂිත කලා නිර්මාණ භාරතයේ දක්නට ලැබෙන අතර, පසු කාලීනව ව්‍යාප්ත වූ අවශේෂ රටවල ස්වාධීන කලා කෘති අතර ඉන්දීය කලා